දිවි අහිමි කරගැනීමක් පසුපස සංකීර්ණ කරුණු ගණනාවක් තිබිය හැක. එනිසා, දිවි අහිමි කරගැනීමක් වාර්තා කිරීමේදී ඊට හේතුවූ කරුණ සරලව නොදැක්විය යුතු බව මාධ්‍ය ආචාර ධර්මයන්හි පැවසේ. ඒසේම දිවි අහිමි කරගත් ආකාරය පළ කිරීම නොකළ යුත්තේ තවෙකෙකු එය අනුකරණය කිරීමට හැකියාවක් ඇති බැවිනි.

එසේම දිවි අහිමි කරගැනීම් පැතිර යා හැකි බව පර්යේෂණ මගින් පෙන්වා දී ඇති කරුණකි. විශේෂයෙන්ම ඇතැම් දිවි අහිමි කරගැනීම් පිළිබඳ පුවත් වාර්තාවන් ඔස්සේ පවා, දිවි අහිමි කරගැනීම් සඳහා වක්‍රාකාරයෙන් අනුබල ලැබීමක් සිදුවීමට හැකියාවක් තිබේ. එනිසාම, දිවි අහිමි කරගැනීම් සම්බන්ධයෙන් වන පුවත් වාර්තාවන්, ලිපි සමගින් උපකාරක අංක සඳහන් කිරීම අත්‍යාවශ්‍ය භාවිතාවකි. දිවි අහිමි කරගැනීමට නැඹුරුවක් ඇති අයෙකුගේ ජීවිතයක් බේරාගැනීමට එය ඉවහල් විය හැක.

මේ අනුව පහත පුවත් වාර්තාවන් ඉදිරිපත් කිරීමේදී දිවි අහිමි කරගැනීම් වාර්තාකරණය සඳහා හඳුන්වා දී ඇති ආචාර ධර්මයන් උල්ලංඝනය වී ඇතැයි පැවසීමට සිදුවේ. පහත ආකාරයේ දිවි අහිමි කරගැනීම් සම්බන්ධ පුවත් පළ කිරීමේදී ඉහත කරුණු කාරණා සම්බන්ධයෙන් සැලකිලිමත් වන ලෙසින් අපි උදක්ම සිහිපත් කරනුයේ, ඒ ඔස්සේ තවත් ජීවිතයක් බේරාගැනීමට ඉඩක් ලැබිය හැකි නිසායි.

හදිසි උපකාරක අංක:
*1333-CCCline
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ -0112696666
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926